රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 197(III)

මගේ අංකය: 543 ඒ 708 ඩී
ආයතන අංශය,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

1982 පෙබරවාරි මස 25 වැනිදින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙතටයි.

වැටුප් සමාලෝචන කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම -
අංක 197 හා 1981.12.29 දිනැති රාජ්‍ය පරිපාලන
චක්‍රලේඛයට සංශෝධන

01. පහත දැක්වෙන නව ඒකාබද්ධ වැටුප් තලයන් සම්බන්ධයෙන් 10:05 වැටුප් ක්‍රමයේ (3) තීරුවෙහි දැක්වෙන "තාවකාලික වැටුප් සැකසීම" මෙහි සඳහන් පරිදි විය යුතුය:-

| වර්තමාන වැටුප් තලය. | නව ඒකාබද්ධ වැටුප් තලය. | තාවකාලික වැටුප් සැකසීම. |
|---|---|---|
| රු. | රු. | රු. |
| 9,240 | 14,880 | 204 |
| 9,600 | 15,240 | 240 |
| 9,960 | 15,600X480 | 276 |
| 10,320 | 16,080 | 192 |

02. සිංහලෙන් 125 පිටුවෙහිද, දෙමළෙන් 138 පිටුවෙහිද, ඉංග්‍රීසියෙන් 150 පිටුවෙහිද දැක්වෙන I ශ්‍රේණියේ භාෂා පරිවර්තකයන් සහ එම පරිමාණයෙහි සිටින අනෙකුත් අය සම්බන්ධයෙන් 5 තීරුවෙහි සඳහන් නව ඒකාබද්ධ වැටුප පහත දැක්වෙන පරිදි සංශෝධනය කෙරේ:-

" රු. 12,120-240X7 සහ 360X5 - රු. 15,600"

03. 13:10 හා ~~10~~ 13:11 වැටුප් ක්‍රමයන් අවලංගු කරනු ලැබේ. ✓

(අ) 13:10 වැටුප් ක්‍රමය වෙනුවට 14:03 වැටුප් ක්‍රමය ආදේශ කළයුතුය.

(ආ) 13:11 වැටුප් ක්‍රමය වෙනුවට 14:04 වැටුප් ක්‍රමය ආදේශ කළයුතුය.
(සිංහල මාධ්‍යයෙන් නිකුත් වූ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 197 (II) හි මෙය දැනටමත් දක්වා ඇත.)

04. 85 පිටුවෙහි දැක්වෙන සටහන, 2 (අ) ඡේදයෙහි ප්‍රතිපාදනයන්ට යටත් වන අතර, එම සටහන් දැක්වෙන පරිදි සියළුම අවස්ථාවන්හිදී පොදුවේ අදාළ වේ.

05. සමහර ශ්‍රේණි සම්බන්ධයෙන් නව ඒකාබද්ධ වැටුප් ක්‍රම වඩා දීර්ඝ වන බැවින් එය හේතුකොටගෙන වඩා ඉහළ උපරිමයන් ඇත. මෙවැනි අවස්ථාවන් සම්බන්ධයෙන් චක්‍රලේඛයේ 4 (IV) ඡේදයේ අවසාන වගන්තිය අදාළ නොවේ.

එහෙයින්, සිය කලින් වැටුප් ක්‍රමයේ උපරිමයෙහි 12 (දොළොස්) මසකට වඩා රැඳිසිටි නිලධාරියකුට, වැටුප් ක්‍රමයේ උපරිමයේ සීමාවට යටත්ව, නව ඒකාබද්ධ වැටුප් ක්‍රමය අනුව ඊ හා සමාන වැටුප් වර්ධක සංඛ්‍යාවක් ප්‍රදානය කිරීමෙන් රැඳිසිටීමේ වාසිය දිය යුතුය. මෙම වාසිය

.....( 2 පිටුව

අන්විය යුත්තේ 1982.01.01 දින සිට පමණි.

06. එල්.බී.ද සිල්වා වැටුප් ක්‍රම ක්‍රියාත්මක වීමෙන් පසු සංශෝධිත/සැකසුණු වැටුප් ක්‍රම සහිත සමහර ශ්‍රේණි හා සම්බන්ධයෙන් අදාළ වන නව ඒකාබද්ධ වැටුප් ක්‍රම IV වැනි පරිශිෂ්ටයෙහි දැක්වේ. එම වැටුප් ක්‍රම පදනම්වූ වැටුපක් 1981 දෙසැම්බර් මාසයේ ඇත්ත වශයෙන්ම නිලධාරියකුට ගෙවා ඇති නම්, නව ඒකාබද්ධ වැටුප් ක්‍රමයන්ට පරිවර්තනය කළ යුත්තේ, ඔහු 1981 දෙසැම්බර් මස ඇත්ත වශයෙන්ම ලබාගත් වැටුප පදනම් කරගෙනය. කෙසේ වෙතත්, සමහර අවස්ථාවන්හිදී "කමිටුව විසින් කරන ලද සංශෝධනය හෝ අවශ්‍යයයි සලකනු ලබන සැකසීම්" යන මැය යටතේ දක්වා ඇති වැටුප් ක්‍රම ඇත්ත වශයෙන්ම ගෙවා නොමැත. ඒවා වැටුප් පරිවර්තන කටයුතු සඳහා පමණක් යොදාගැනීමට තිබුණ "කල්පිත" වැටුප් ක්‍රම විය. එවැනි අවස්ථාවන්හිදී, එවැනි නිලධාරියකු 1981 දෙසැම්බර් මාසයේදී ලබාගත් වැටුප පළමුකොට, පියවරෙන් පියවර තැබීමේ පදනම මත "කල්පිත" වැටුප බවට පරිවර්තනය කර, ඉන් අනතුරුව නව ඒකාබද්ධ වැටුප් ක්‍රමයෙහි අනුරූප වැටුප් තලයට පරිවර්තනය කළ යුතුය.

07. ස්ථිර වැටුපක් නියමකර ඇති නිලධාරියකුට, 1981.12.31 දින ඔහු සිටි වැටුප්තලය කුමක් වුවත්, 1982.01.01 දින සිට ස්ථිර වැටුප ගෙවිය යුතුය.

08. 17:11 වැටුප් ක්‍රමය අතිරේක ලේකම්වරුන්ට හා දිස්ත්‍රික් ලේකම්වරුන්ට අදාළ වේ.

09. රජයේ සේවාවේදී තමා අවසාන වශයෙන් ලබාගත් වැටුප මත රජයේ සේවා කනතුරකට යළි බඳවාගත් රජයේ නිලධාරියකුට, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක. 197 යටතේ ඔහුට අදාළ වන අනුරූප වැටුප, 1982.01.01 දින සිට ගෙවිය යුතුය. ජීවන වියදම් දර්ශකය පදනම් වූ ජීවන වියදම් දීමනාවද යළි බඳවාගැනීමේ තලධාරයා ඔහුට ගෙවිය යුතුය.

Siriwardhana

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්.